# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல. / My Ref. CSS/11/3/11 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.03.23

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ තොරතුරු තාක්ෂණ (01/2021)**

**දකුණු පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ**
**ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත,**

## දකුණු පළාත් ඉලෙක්ට්‍රොනික තැපැල භාවිතා කිරීම

දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ සහ ආයතන සඳහා නිල විද්‍යුත් තැපැල් ලිපින ලබා දීමේ අරමුණින් දක්ෂිණපාය පරිගණක ජාලය සම්බන්ධව නව Mail Server එකක් ස්ථාපනය කර ඇත. රාජකාරි විද්‍යුත් තැපැල් ලිපිනයන් සකස් කර සියලුම අමාත්‍යාංශ සහ ආයතන දැනුවත් කිරිම සිදුකර තිබේ. සියලුම අමාත්‍යාංශ සහ ආයතන සඳහා විද්‍යුත් තැපැල් ලිපින ලබා දී ඇති අතර ඒ සම්බන්ධව දැනුවත් කිරීම් ද කර ඇති බව මා වෙත දන්වා ඇත.

02. දකුණු පළාතේ සියළුම අමාත්‍යාංශ හා ආයතනවල රාජකාරි ලිපිනයන් සකස් කිරිමේ කටයුතු හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු දක්ෂිණපාය පරිගණක ජාල උපදේශකගේ උපදෙස් මත දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ පරිගණක අංශය විසින් සිදුකර 2017 වසර වන විට මෙම ඉලෙක්ට්‍රොනික තැපැල ක්‍රියාත්මක කර සියළුම ආයතන ප්‍රධානීන් සහ එම නිලධාරීන් ට මේ පිළිබඳ පුහුණු ලබා දී ඇති බව මා වෙත තහවුරු කොට ඇත.

03. මේ දක්වා රාජකාරි ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපින ලබාදී ඇති ආයතන හා එම නිලධාරීන්ගේ තොරතුරු ප්‍රධාන අමාත්‍යාංශය www.cm.sp.gov.lk/Media menu/Provincial Email Directory වෙබ් ලිපිනයෙන් ලබා ගත හැකිය.

04. එසේ වුව ද, බොහෝ ආයතන තව දුරටත් අන්තර්ජාලය ඔස්සේ ලබාදෙන ඉලෙක්ට්‍රොනික තැපැල් සේවාවන් (free mail-Gmail/Yahoo mail ආදී) භාවිතා කරන බවට නිරීක්ෂණය වී ඇත. මෙසේ රාජකාරීමය කටයුතු සඳහා මෙම ඉලෙක්ට්‍රොනික තැපැල් සේවා භාවිතාකිරිම නිසා දත්ත සහ තොරතුරු (Date & Information) වල ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානම් සහගත තත්වයක් උද්ගතවිය හැක.

05. විගණන විමසුම් පරික්ෂණ ආදී කටයුතුවලදී සාධාරණීකරනය සඳහා මෙම රාජකාරි නොවන ඉලෙක්ට්‍රොනික තැපැල තුලින් තොරතුරු ලබාගත නොහැක. එබැවින් මෙබඳු ඉලෙක්ට්‍රොනික තැපැල් ගිණුම් හරහා සිදුකෙරෙන ගණුදෙනුවල විශ්වාසවන්තභාවය සාක්ෂාත් නොවේ.

06. ඔබ ආයතන වල විද්‍යුත් තැපැල භාවිතා කළ හැකි සියළුම රාජකාරි සන්නිවේදන යෙදවුම් සඳහා (නිදසුන්: ලිපි ශීර්ෂ/ වෙබ් අඩවි) සඳහා රාජකාරි විද්‍යුත් තැපැල් ලිපින පමණක් භාවිතා කළ යුතුය.

07. ඉහත කරුණු සැලකිල්ලට ගෙන සියලුම රාජ්‍ය ආයතනයන් 2021.04.01 දින සිට රාජකාරි කටයුතු සඳහා රාජකාරි විද්‍යුත් තැපැල් ලිපිනයන් පමණක් භාවිතා කළයුතු වන අතර අලුතින් විද්‍යුත් තැපැල් ලිපින සකස්කර ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රය පුරවා 2021.03.31 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කළ යුතුය. එහි දී දෘඪ පිටපත තැපෑල මගින් මා වෙත එවීමටත් මෘදු පිටපත it@cs.sp.gov.lk ලිපිනයට හා info@cm.spgov.lk ලිපිනයට යොමුකරන ලෙසත් කාරුණිකව දන්වමි.

08. මේ සම්බන්ධව ගැටලු පවතින්නේ නම් ඒ පිළිබඳව ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශයේ පරිගණක වැඩසටහන් සම්පාදක (091- 4946367) වෙතින් හෝ දක්ෂිණපායේ පරිගණ වැඩසටහන් සම්පාදක (091 - 4946621) වෙතින් විමසීම් සිදු කරන ලෙස ද දන්වමි.

**ආර්.සී.ද සොයිසා**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.